" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2022 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2022.08.19

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පාලන චක්‍රලේඛ අංක 03/2022

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධානනීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පරිබාහිර වෙනත් තනතුරක් භාරගැනීම සඳහා පූර්ව තනතුරෙන් විධිමත් පරිදි ඉවත් වූ නිලධාරියෙකු නැවත පූර්ව සේවය සඳහා පැමිණීම</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2017 ට සමගාමීව මෙම පාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 3.1 වගන්තියට අනුව රජයේ සේවයෙහි හෝ ඉන් පිටස්තරව හෝ වෙනත් තනතුරක් බාර ගැනීම සඳහා සිය තනතුර අතහැරියාවූ නිලධාරියෙකුටවත්, ස්ථිරව මුදා හරිනු ලැබූ නිලධාරියෙකුටවත් තමා කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට අයිතියක් නැත. එසේ වූවද, නිලධාරියෙකු කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් කිසියම් හෝ සුවිශේෂී වූ කරුණු හා අවස්ථා යටතේ එම ඉල්ලීමට ඉඩ දිය යුතු යැයි පත්වීම් බලධරයාට හැඟියන අවස්ථා වලදී පහත පරිදි කටයුතු කල යුත්තේය.

03. එවැනි නිලධාරියෙකුට නැවත තමා කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට අවශ්‍ය වන්නේ නම්, එවැනි අවස්ථාවක ඒ සම්බන්ධයෙන් වූ ලිඛිත ඉල්ලීමක් වර්තමාන තනතුරේ පත්වීම් බලධරයාගේ එකඟතාවය සහ පූර්ව තනතුරේ පත්වීම් බලධරයාගේ නිර්දේශද සහිතව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය.

උදා - ශ්‍රී ලංකා ගුරු සේවයේ තනතුරක් භාර ගැනීම සඳහා සංවර්ධන නිලධාරි සේවයෙන් ස්ථිරව මුදා හරිනු ලැබූ නිලධාරියෙකු නැවත සංවර්ධන නිලධාරි සේවයේ තනතුර සඳහා පෙරළා පැමිණීමට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක එම ඉල්ලීම පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය සහ බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

04. එවැනි ඉල්ලීමක් පිළිබඳ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අදාළ පත්වීම් බලධරයාට දැනුම්දෙන තුරු කිසිදු කරුණක් මත එම නිලධාරයා නැවත පූර්ව සේවයට බඳවා නොගත යුතුය.

05. එබඳු නිලධාරියෙකුට තමා කලින් දැරූ තනතුරකට පෙරළා පැමිණීමට අවසර දෙතොත්, එම පත්වීම අදාල බඳවා ගැනීමේ පරිපාටියෙන් පිටස්තරව ආරම්භක වැටුප් පියවරෙහි පිහිටුවා කරනු ලබන අලුත් පත්වීමක් ලෙස සැලකිය යුතු අතර නිලධාරියාගේ ඉල්ලීම පිට හා අදාළ පත් කිරීම් බලධාරියාගේ අනුමැතිව ඇතිව කලින් දැරූ තනතුරට පෙරළා යවනු ලැබූ විට එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වය නිගමනය කෙරෙනුයේ නිලධාරියා අදාළ තනතුරට හෝ අදාළ ශ්‍රේණියට හෝ පන්තියට පෙරළා පැමිණි දිනය අනුව වන්නේය. සිය පූර්ව සේවය පදනම් කොට ජ්‍යෙෂ්ඨතාවය සඳහා කිසිදු අයිතිවාසිකමක් කියා පෑමට මෙවැනි නිලධාරින්ට හිමිකමක් නැත්තේය.

05. 1 එසේකුදු වුවද, රජයේ අවශ්‍යතාවය අනුව තමා කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට අනුමැතිය ලබා දෙන්නේ නම්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශය අනුව නිලධාරියා එකී තනතුර අත්හළ අවස්ථාවේදී එම තනතුරේ ඔහු සේවය කර ඇති කාලයත් , එම වැටුප් පරිමාණයේ ආරම්භක පියවරට පත් කරන ලද නිලධාරියෙකුට ඉහත සඳහන් වැටුප් පරිමාණය වෙනස් වූ අවස්ථාවකදී එහි ඉහළ වැටුප් පියවරකට එළඹීමට ගතවන කාලයත් යන දෙකින් අඩු කාලයට අනුව ඔහුගේ ජ්‍යෙෂ්ඨතාව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

05.2 එවැනි අවස්ථාවකදී එම නිලධාරියාට වැටුප් පරිමාණයේ ආරම්භක පියවරට වඩා ඉහළ වැටුපක් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිව ඇතිව ලබාදිය හැකිය. නිලධරයා තනතුර අතනොහැර සේවයේ රැඳී සිටියේනම් ඔහු විසින් ලැබිය හැකිව තිබූ වැටුපට වඩා අධික වැටුපක් එම තනතුරට ආපසු පැමිණීමේදී ලබා ගැනීමට ඔහුට කවර හේතුවක් නිසාවත් ඉඩ ලබා දෙනු නොලැබේ.

06. එසේම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව පූර්ව සේවයට පෙරළා පැමිණෙන නිලධාරින්ගේ පත්වීම ශූන්‍ය හා බල රහිත වන්නේය. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව පූර්ව සේවයට පෙරළා පැමිණෙන නිලධාරින්ට පත්වීමක් ලබාදීම මඟින් සිදුවන හානිය හා පාඩුව පිළිබඳව පත්වීම ලබාදුන් නිලධාරියා පුද්ගලිකවම වගකිව කිය යුතු අතර එවැනි පත්වීමක් භාර ගැනීම මගින් තමන්ට සිදුවන හානිය හා පාඩුව පත්වීම භාරගනු ලබන නිලධාරියා පුද්ගලිකවම භාරගත යුතු වන්නේය.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

| | | | |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2136600<br>011-2136650<br>011-2136700 | මගේ අංකය / எனது இல. / My No. | PSC/EST/08-05/02/2014 |
| ලේකම් / செயலாளர் / Secretary | 011-2136602 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2369302<br>011-2369305 | දිනය / திகதி / Date | 2017.09.29 |
| විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail | sec-psc@sltnet.lk | | |
| වෙබ් අඩවිය / இணையத்தளம் / Website | www.psc.gov.lk | | |

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**


රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 03/2017

මගේ අංක : PSC/EST/08-05/02/2014

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 177, නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05

2017 සැප්තැම්බර් මස 29 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සේවයෙන් පරිබාහිර වෙනත් තනතුරක් භාරගැනීම සඳහා පූර්ව තනතුරෙන් විධිමත් පරිදි ඉවත් වූ නිලධාරියෙකු නැවත පූර්ව සේවය සඳහා පැමිණීම</u>**

ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 3.1 වගන්තියට අනුව රජයේ සේවයෙහි හෝ ඉන් පිටස්තරව හෝ වෙනත් තනතුරක් බාර ගැනීම සඳහා සිය තනතුර අතහැරියා වූ නිලධාරියෙකුටවත්, ස්ථිරව මුදා හරිනු ලැබූ නිලධාරියෙකුටවත් තමා කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට අයිතියක් නැත. එසේ වුවද, නිලධාරියෙකු කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් කිසියම් හෝ සුවිශේෂී වූ කරුණු හා අවස්ථා යටතේ එම ඉල්ලීමට ඉඩදිය යුතු යැයි පත්වීම් බලධරයාට හැඟියන අවස්ථා වලදී පහත පරිදි කටයුතු කළ යුත්තේය.

02. එවැනි නිලධාරියෙකුට නැවත තමා කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට අවශ්‍ය වන්නේ නම්, එවැනි අවස්ථාවක ඒ සම්බන්ධයෙන් වූ ලිඛිත ඉල්ලීමක් වර්තමාන තනතුරේ පත්වීම් බලධරයාගේ එකඟතාවය සහ පූර්ව තනතුරේ පත්වීම් බලධරයාගේ නිර්දේශද සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය.

*උදා - ශ්‍රී ලංකා ගුරු සේවයේ තනතුරක් භාර ගැනීම සඳහා සංවර්ධන නිලධාරි සේවයෙන් ස්ථිරව මුදා හරිනු ලැබූ නිලධාරියකු නැවත සංවර්ධන නිලධාරි සේවයේ තනතුර සඳහා පෙරළා පැමිණීමට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක එම ඉල්ලීම අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.*

03. එවැනි ඉල්ලීමක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය අදාළ පත්වීම් බලධරයාට දැනුම් දෙන තුරු කිසිදු කරුණක් මත එම නිලධරයා නැවත පූර්ව සේවයට බඳවා නොගත යුතුය.

04.එබඳු නිලධාරියකුට තමා කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට අවසර දෙතොත්, එම පත්වීම අදාළ බඳවා ගැනීමේ පරිපාටියෙන් පිටස්තරව ආරම්භක වැටුප් පියවරෙහි පිහිටුවා කරනු ලබන අලුත් පත්වීමක් ලෙස සැලකිය යුතු අතර නිලධාරියාගේ ඉල්ලීම පිට හා අදාළ පත් කිරීම් බලධාරියාගේ අනුමැතිය ඇතිව කලින් දැරූ තනතුරට පෙරළා යවනු ලැබූ විට එම නිලධරයාගේ ජ්‍යෙෂ්ඨත්වය නිගමනය කෙරෙනුයේ නිලධාරියා අදාළ තනතුරට හෝ අදාළ ශ්‍රේණියට හෝ පන්තියට පෙරළා පැමිණි දිනය අනුව වන්නේය. සිය පූර්ව සේවය පදනම් කොට ජ්‍යෙෂ්ඨතාවය සඳහා කිසිදු අයිතිවාසිකමක් කියා පෑමට මෙවැනි නිලධාරින්ට හිමිකමක් නැත්තේය.

04.1 එසේකුදු වුවද, රජයේ අවශ්‍යතාවය අනුව තමා කලින් දැරූ තනතුරට පෙරළා පැමිණීමට අනුමැතිය ලබා දෙන්නේ නම්, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණ හා නිර්දේශය අනුව නිලධාරියා එකී තනතුර අත්හළ අවස්ථාවේදී එම තනතුරේ ඔහු සේවය කර ඇති කාලයත්, එම වැටුප් පරිමාණයේ ආරම්භක පියවරට පත් කරන ලද නිලධාරයෙකු ඉහත සඳහන් වැටුප් පරිමාණය වෙනස් වූ අවස්ථාවකදී එහි ඉහළ වැටුප් පියවරකට එළඹීමට ගතවන කාලයත් යන දෙකින් අඩු කාලයට අනුව ඔහුගේ ජ්‍යෙෂ්ඨතාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව තීරණය කළ හැකිය.

04.2 එවැනි අවස්ථාවකදී එම නිලධාරියාට වැටුප් පරිමාණයේ ආරම්භක පියවරට වඩා ඉහළ වැටුපක් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඇතිව ලබාදිය හැකිය. නිලධාරියා තනතුර අතනොහැර සේවයේ රැඳී සිටියේනම් ඔහු විසින් ලැබිය හැකිව තිබූ වැටුපට වඩා අධික වැටුපක් එම තනතුරට ආපසු පැමිණීමේදී ලබා ගැනීමට ඔහුට කවර හේතුවක් නිසාවත් ඉඩ නොදිය යුතුය.

05.එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව පූර්ව සේවයට පෙරළා පැමිණෙන නිලධාරීන්ගේ පත්වීම් ශූන්‍ය හා බල රහිත වන්නේය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව පූර්ව සේවයට පෙරළා පැමිණෙන නිලධාරීන්ට පත්වීම් ලබාදීම මගින් සිදුවන හානිය හා පාඩුව පිළිබඳව පත්වීම ලබාදුන් නිලධාරියා පුද්ගලිකවම වගකිව යුතු අතර එවැනි පත්වීමක් භාර ගැනීම මගින් තමන්ට සිදුවන හානිය හා පාඩුව පත්වීම භාරගනු ලබන නිලධාරියා පුද්ගලිකවම භාරගත යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව